# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.04 පැය 2300 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/388/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සමාජ මාධ්‍ය ජාලා වල සංසරණය වන වීඩියෝ පටයක් සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කිරීම.**

වෙරළබඩ පොලිස් වසමේ ජින්තුපිටිය ප්‍රදේශයේ නිවාස සෝදිසි කිරීමක් සම්බන්ධයෙන් පොලිසියට චෝදනා කරමින් කාන්තාවන් පිරිසක් පොලිසියට දෝෂා රෝපනය කරමින් අදහස් දක්වන වීඩියෝ පටයක් මේ දිනවල සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වෙමින් පවතී.

මේ සම්බන්ධයෙන් කොළඹ උතුර කොට්ඨාස භාර නිලධාරී මගින් වාර්තාවක් කැඳවීමට කටයුතු කරන ලද අතර ඒ අනුව 2026.03.03 දින කොළඹ උතුර ජම්පටාවීදිය ප්‍රදේශය ආවරණය වන පරිදි සිදු කරන ලද සෝදිසි මෙහෙයුමක් මෙම වීඩියෝ පටයට අදාල සිදුවීමට පාදක වී ඇති බවට වාර්තා කර ඇත.

2026.03.03 දින සවස 0400 සිට රාත්‍රී 0730 දක්වා කොළඹ උතුර කොට්ඨාස භාර නිලධාරීගේ අධීක්ෂණය යටතේ මෙම ප්‍රදේශයේදී සංවිධානාත්මක අපරාධකරුවන් පාලනය කිරීම, මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීම හා එයට අදාල ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ උතුර කොට්ඨාසයේ සියළුම ස්ථානාධිපතිවරුන් දැනුවත් කර ඉහත ප්‍රදේශය ආවරණය වන පරිදි වටලා සෝදිසි කිරීමේ මෙහෙයුමක් දියත් කරන ලද බවට වාර්තා කර ඇත.

විදේශගතව සැඟව සිටින මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ සංවිධානාත්මක අපරාධකරුවන් කිහිප දෙනෙකුගේ නිවාස මෙම ප්‍රදේශයේ පිහිටා ඇති බවත් ඔවුන් විදේශගතව සිටිමින් තවදුරටත් මෙම ප්‍රදේශ මූලික කරගෙන මත්ද්‍රව්‍ය ජාවාරම සහ සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් සිදු කිරිම මැඩපැවැත්වීම මෙම මෙහෙයුමේ අරමුණ බව වාර්තා කර ඇත.

මෙම වීඩියෝ පටයේ සඳහන් ආකාරයට යම් අයෙකුගේ දේපළ හෝ මුදල් අස්ථානගත වීමක් සිදුවී ඇත්නම් ඒ සම්බන්ධව අගතියට පත් පාර්ශයට පැමිණිලි කිරීමට හැකියාව ඇති බවත් වීඩියෝ පටයේ සඳහන් කරන කරුණු සත්‍යයෙන් තොර බවටත් මෙම වාර්තාව මඟින් දන්වා ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## Clarification Regarding a Video Clip Circulating on Social Media

A video clip currently circulating on social media shows a group of women making allegations that the Police conducted a house search in the Jinthupitiya area of the Coastal Police Division and making various comments regarding the incident.

In response to this matter, the Officer-in-Charge of the Colombo North Division has called for a report. According to the report received, the incident referred to in the video is related to a search operation carried out in the Jampata Street area of Colombo North on 03.03.2026.

The report further states that a raid and search operation was conducted in the above area from 4.00 p.m. to 7.30 p.m. on 03.03.2026 under the supervision of the Colombo North Divisional Officer-in-Charge. The operation was implemented with the participation of the Officers-in-Charge of all police stations in the Colombo North Division, with the objective of controlling organized criminal activities, suppressing drug trafficking, and apprehending individuals involved in such illegal activities.

It has also been revealed that several houses in this area belong to organized criminals involved in drug trafficking who are currently evading arrest while residing overseas. Accordingly, the purpose of this operation was to curb drug trafficking and organized criminal activities connected to these individuals and locations.

Furthermore, the report indicates that if any individual believes that their property or money has been misplaced, as alleged in the video, they have the right to lodge a complaint with the Police for further investigation. However, according to the information obtained so far, the allegations presented in the video clip are not accurate.

**Police Media Division**